**X press peral නැවේ ඩොලර් බිලියනයක වන්දිය අහිමිවීම පිළිබඳ විමර්ශනයක් පවත්වන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට විශේෂ පැමිණිල්ලක් බාරදීමෙන් අනතුරුව සිවිල් අයිතිවාසිකම් පිළිබඳ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති විශේෂඥ වෛද්‍ය චමල් සංජීව මහතා කළ ප්‍රකාශය**

අපි අද ජාතික වෘත්තීය හා සිවිල් පෙරමුණ විදියට අල්ලස් හා දූෂණ විරෝධී කොමිෂන් සභාවට විශේෂ පැමිණිල්ලක් බාර දුන්නා. ඒ තමයි, මුළු රටම දන්නවා X press Pearl නෞකාව ලංකාව මුහුදේදී ගිනිගෙන ගිලී යෑම නිසා ලංකාවේ සාගර කලාපයට පරම හානියක් සිදු වුණා. සමුද්‍ර ජීවීන්ට සහ ධීවර පවුල් දහස් ගණනකට බරපතල අගතියක් සිදු වුණා.

මේ සම්බන්ධව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ 168, 176, 184 සහ 277 යන අංක යටතේ 2021 අවුරුද්දේදී මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කරනු ලැබුවා. මේ පෙත්සම් විභාග කරලා 2025 අවුරුද්දේදී එවකට අග්‍රවිනිශ්චයකාර මුර්දු ප්‍රනාන්දු මැතිනිය, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරු යසන්ත කෝඩාගොඩ මැතිතුමන් ඇතුළු පංච පුද්ගල විනිශ්චයකාර මණ්ඩලයක් මගින් මේ Express Pearl නෞකාව නිසා සිදුවෙච්ච සමුද්‍ර හානිය සහ මේ ධීවර පවුල්වලට වෙච්ච හානිය කේන්ද්‍ර කරගෙන මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවී ඇති බව සඳහන් කරලා ඇමරිකානු ඩොලර් බිලියනයක මුදලක් ශ්‍රී ලංකා රජයට ගෙවිය යුතු බවට සුවිශේෂී නඩු තීන්දුවක් ලබා දෙනු ලැබුවා.

මේ නඩු තීන්දුව සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුව බලයට පත්වුණාට පස්සේ විශාල ලෙස මාධ්‍ය හරහා පවා කතාබහට ලක්කළා, අදාළ වන්දි මුදල අය කර ගැනීම සඳහා වන නඩු තීන්දුව ගැන. නමුත් එම නඩු තීන්දුව ලබා දීමේදී ඉතා පැහැදිලිව අදාළ ඩොලර් බිලියනයක මුදල කාණ්ඩ වශයෙන්, පළමු මාස දෙක ඇතුළත ඇමරිකානු ඩොලර් මිලියන 250ක්, ඊට පසුව එතැන් සිට ගෙවී යන මාස හතරක කාලසීමාවේදී ඉතිරි ඇමරිකානු ඩොලර් මිලියන 500ක්, එම නඩු තීන්දුවේ ඉදලා වර්ෂයක් ඇතුළත, ඒ කියන්නේ මේ අවුරුද්දේ ජූලි මාසය වන විට ඉතුරු ඇමරිකානු ඩොලර් මිලියන 250ක් විදියට ඇමරිකානු ඩොලර් බිලියනයක අති විශාල දැවැන්ත වන්දි මුදලක් පළමු වටයේදී ලබා දෙන්න එම සුවිශේෂී නඩු කටයුත්තේදී හිටපු අගවිනිසුරුතුමිය ප්‍රමුඛ පංච පුද්ගල විනිශ්චයකාර මණ්ඩලයට සමත් වුණා.

ඒ වගේම එම නඩුවේදී විශේෂයෙන්ම සඳහන් කළා, මෙය පළමු වටයේ ලබාදෙන වන්දි මුදලක් වුණාට මෙතැනින් එහාට ගිහිල්ලා තවදුරටත් වන්දි මුදල් අය කරගැනීම සම්බන්ධයෙන් Compensation Commission එකක්, නැත්නම් වන්දි මුදල් අය කරගැනීමේ කටයුත්ත තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා, වන්දි මුදල් අය කරගැනීම සඳහා වන කොමිෂන් සභාවක් පත් කරලා මෙය දිගටම ක්‍රියාත්මක වෙන්න ඕන කියලා.

ඒ වගේම තමයි ඒ වන විට අගවිනිසුරුතුමිය මුර්දු ප්‍රනාන්දු මහත්මිය විශ්‍රාම යාමට නියමිත නිසා ඉතා පැහැදිලිවම නඩුවේදී සඳහන් වෙනවා මෙම නඩු කටයුත්ත

තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක විය යුතුයි කියන කරුණ. මේක Proceed වෙන නඩු කටයුත්තක් බවත් ඉතා පැහැදිලිව සඳහන් වෙලා තමයි එම නඩුව අවසාන වෙන්නේ. ඒ කියන්නේ ඊට පසුව එන අගවිනිසුරුතුමාට වගකීමක් පැවරෙනවා මේ කටයුත්ත අඛණ්ඩව ගිහිල්ලා මේ රටේ ශ්‍රී ලංකා රජයට, ලංකාවේ මහජනතාවට මේ නඩුව හරහා සාධාරණයක් ඉෂ්ට විය යුතු බව.

දැන් මේ නඩු කටයුත්ත අදාළ කාලසීමාව ඉක්මවලා ගිහිල්ලා තියෙද්දීත් මේ අදාළ නැව් සමාගමෙන් ලැබිලා තියෙන්නේ ඇමරිකානු ඩොලර් මිලියනයයි. ඒ කියන්නේ අද වන විට නඩුව අවසාන වෙලා අවුරුද්දක් ගිහිල්ලා, මුල් නඩු තීන්දුව දීලා අවුරුද්දක් ඉක්මවා ගිහිල්ලා ඇමරිකානු ඩොලර් මිලියන 999ක් අය කරගන්න ශ්‍රී ලංකා රජය අසමත් වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි පළමු පංච පුද්ගල නඩු කටයුත්තෙන් පස්සේ පත්කරන ත්‍රිපුද්ගල විශේෂ අධිකරණයේදී, අදාළ ශ්‍රේෂ්ඨාධිකරණයේදී, පළමුවෙන්ම පංච පුද්ගල විනිශ්චයාසනයක් මගින් ක්‍රියාත්මක වෙච්ච ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කටයුත්ත පසුව ත්‍රිපුද්ගල විනිශ්චයාසනයක් මගින් තමයි මේ නඩු කටයුත්ත පසුගිය කාලයේ ක්‍රියාත්මක වෙන්නේ.

එතකොට මෙම කියන නඩුවේදී අදාළ වන්දි මුදල් අය කර ගැනීමට නොහැකිවීම නිසා නැව් සමාගම ශ්‍රේෂ්ඨාධිකරණය අපහාසයට ලක්කර ඇති බවට දිගින් දිගටම පෙත්සම්කරුවන් පෙන්වා දීමත් සිදුකර තිබෙනවා. නමුත් අවාසනාව කියන්නේ අද දක්වා අර ඉතුරු ඩොලර් මිලියන 999 අය කර ගැනීම සම්බන්ධ කටයුත්ත ක්‍රියාත්මක වන බවක් පෙනෙන්න ලැබෙන්නේ නැහැ.

මේ සම්බන්ධව ඉතා පැහැදිලිව පසුගිය සතිවලදී පාර්ලිමේන්තුව තුළදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රශ්න මතු කළා. Express Pearl වන්දි මුදල් අය කර ගැනීමට නොහැකි වන අන්දමට මේ නීතිමය කටයුතුවල බාධා ක්‍රියාත්මක වුණේ කොහොමද, ඒ සම්බන්ධව වර්තමාන අගවිනිසුරුතුමාටත්, ඒ වගේම තමයි මේ නෛතික කටයුත්ත සම්බන්ධ වෙච්ච ක්‍රියාවලියේ අඩුපාඩු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ චෝදනා එල්ල වුණා.

අපි දන්නවා අපේ රටේ මිනිස්සු දේශපාලකයන්ට චෝදනා කරනවා, නිලධාරීන්ට චෝදනා කරනවා. මිනිස්සුන්ට තියෙන එකම විශ්වාසදායක තැන තමයි ගරු අධිකරණය. එනිසා මේ පංච පුද්ගල විනිශ්ච සභාව දුන්නු නඩු තීන්දුව, ඊට පස්සේ ත්‍රිපුද්ගල විනිශ්ච සභාවක් ඉදිරියේදී නිසි පරිදි ක්‍රියාත්මක නොවීම ගැන දැන් රටේ බලවත් විදියට සාකච්ඡාවට භාජනය වෙනවා.

එතකොට මේ ත්‍රිපුද්ගල විනිශ්ච සභාව මගින් මේ කටයුත්ත ඉදිරියට කරගෙන ගිහිල්ලා අර ඇමරිකානු ඩොලර් මිලියන 999ක මුදල අය කර ගැනීම සම්බන්ධ වන ක්‍රියාවලියේ ප්‍රමාදය, එහෙම වුණාම මේ රටේ අධිකරණය ගැන, අධිකරණ පද්ධතිය ගැන මහජනතාවගේ තිබෙන විශ්වාසයට කැලලක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා අපි අද අල්ලස් කොමිසමට ඉල්ලීමක් කළේ, මේ ඇමරිකානු ඩොලර් මිලියන 999ක මුදල ලංකා රජයට අය කර ගැනීමට බැරිවීම සම්බන්ධව වර්තමාන ආණ්ඩුව

යටතේ, වර්තමාන අගවිනිසුරුතුමන් යටතේ නොහැකිවීමට හේතුව සම්බන්ධව පුළුල් විමර්ශනයක් සිදු කරන්න.

ඒ වගේම තමයි අපි මේ පෙත්සම පාදක කරගෙන ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අද විසඳෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී මේ විනිශ්ච සභාවල හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලා තවදුරටත් 22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධ විභාග වන අධිකරණයේ කටයුතුවලදී අදාළ සාකච්ඡාවලට භාජනය වන පෙත්සම් විභාග කරන්න සුදුසුද කියන ගැටලුව අපි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසීමට ලක් කරන්නත් බලාපොරොත්තු වෙනවා.

ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියන්නේ, මේ Express Pearl නෞකාවේ වන්දි මුදල අය කර ගැනීමට නොහැකිවීමේ ඇමරිකානු ඩොලර් මිලියන 999ක ක්‍රියාව, අපට පෙනෙන දෙයක් තමයි අල්ලස් හා දූෂණ විරෝධී පනත යටතේ ගත්තට පස්සේ, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ 111 වගන්තිය ප්‍රකාරව (2023 අල්ලස් හා දූෂණ විරෝධී පනතේ 111 වගන්තිය ප්‍රකාරව) රාජ්‍යයට යම් අලාභයක් සිදු කරමින් නැව් සමාගමට යම් වාසියක් වන අන්දමට යම් කිසි නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ක්‍රියාත්මක වී ඇද්දැයි කියලා අපි විමසන්න කියලා අපි ඉල්ලීමකුත් කළා. ඒ වගේම මේකේ ප්‍රගතිය අපට දැනුම් දෙන්න ලෙසත් අපි ඉල්ලීමක් කළා.

දැන් අපි හිතනවා අල්ලස් හා දූෂණ විරෝධී කොමිෂන් සභාව මේ ඇමරිකානු ඩොලර් මිලියන 999ක මුදල් ලංකා රජයට අය කර ගැනීමට බැරිවීම සම්බන්ධව කඩිනමින් විමර්ශනය කරලා මේකේ සත්‍ය අසත්‍යතාව රටට පැහැදිලි කරාවි කියලා. ඒ වගේම අපි විශ්වාස කරනවා ශ්‍රේෂ්ඨාධිකරණය මේ ධීවර පවුල් 19,000ක් වෙනුවෙන් මේ වන්දි මුදල නැවත අය කර දෙමින් මේ රටේ මහජනතාවට සාධාරණයක් ඉෂ්ට කරලා, ශ්‍රේෂ්ඨාධිකරණය ගැන විශ්වාසය තව තවත් වැඩිවර්ධනය වන අන්දමට කඩිනමින් තීන්දුවක් ගත හැකි පරිසරයක් නීති පද්ධතිය තුළ නිර්මාණය වේවි කියලා.

ඒ නිසා අපි හිතනවා අපි මේ රටේ මහජනතාව වෙනුවෙන් අධිකරණයේ ගෞරවය ආරක්ෂා කරමින්, අධිකරණය ගැන විශ්වාසය වැඩි කර ගැනීම සඳහා කවුරුන් හෝ කෙනෙක් අධිකරණ පද්ධතියට, අගවිනිසුරුවරයාට, මේ ත්‍රිපුද්ගල විනිශ්චයකාර මණ්ඩලයට කරන චෝදනාවක් තිබෙනවා නම් ඒක අධිකරණ පද්ධතියට සුබ නොවන නිසා, අධිකරණ ක්‍රියාවට සුබ නොවන නිසා, මේ රටේ අධිකරණයේ විශ්වාසවන්තභාවයට සුබ නොවන නිසා අන්න ඒ අපැහැදිලිභාවය ඉවත් කර දීලා, අගවිනිසුරු හා මේ රටේ අධිකරණ පද්ධතිය ගැන විශ්වාසය ඇති කරන්න අපේ මේ පැමිණිල්ල පාදක කරගෙන අල්ලස් කොමිසම සහ ශ්‍රේෂ්ඨාධිකරණය විමර්ශනය කරාවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.